# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2471/71 - 2026 ජනවාරි මස 17 වැනි සෙනසුරාදා - 2026.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 184, රොටේ ග්‍රාම නිලධාරි වසමේ, පල්ලේරොට ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයාගේ කැඩැස්තර සිතියම් අංක 830257 කලාප අංක 01 හි පත්‍ර අංක 02 කැබලි අංක 01, 02 සහ 03 පෙන්නුම්කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4514 ක් වන ඉඩම් කැබලි:

01. කැබලි අංක 01
ඉඩමේ නම: පල්ලේරොට ලැබීම; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත;හිමිකම් කියන අය: පුද්ගලික;මුල් හිමිකම් කියන අය: හිමිකරු සොයාගත නොහැක;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0713.

02. කැබලි අංක 02
ඉඩමේ නම: පල්ලේරොට ලැබීම; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත;හිමිකම් කියන අය: පුද්ගලික;මුල් හිමිකම් කියන අය: හිමිකරු සොයාගත නොහැක;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0817.

03. කැබලි අංක 03
ඉඩමේ නම: පල්ලේරොට ලැබීම; ඉඩමේ විස්තරය: වාරිමාර්ග ඇළ;හිමිකම් කියන අය: පුද්ගලික;මුල් හිමිකම් කියන අය: යූ. ඒ. ලෙනාඩ්, පල්ලේරොට, මාමඩල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2984.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 පෙබරවාරි මස 23 වැනි දින පෙරවරු 10.30 ට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 පෙබරවාරි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චින්තා පී. ඩබ්. වන්නිආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2026 ජනවාරි මස 12 වැනි දින,
අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0178